


# ඊරියගොල්ල ආදාහනාගාරය සහ පොදු සුසාන භූමිය

## මෙහෙයුම් අත්පොත 2023






දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

Tel/Fax 036-2222575 Email : dehiowitaps@yahoo.com

# දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ දැක්ම

"තිරසර සංවර්ධනයෙන් පුබුදමු ගම් දනවු"

# දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මෙහෙවර ප්‍රකාශය

පවත්නා සම්පත් කාර්යක්ෂමව හා සඵලමත්ව යොදවමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛය, පොදු උපයෝගීතා සේවා, පොදු මංමාවත් ඇතුළු පහසුකම් ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුබසාධනය සම්පාදනය හා ප්‍රවර්ධනය කිරීම තුළින් සුවදායී පරිසරයක් සහිත තිරසර සංවර්ධිත ප්‍රදේශයක් බවට පත් කිරීම.

# ආදාහනාගාර

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත.

එම බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය පවත්වාගෙන යාම විධිමත් කිරීම,පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සිදු කරයි.

- සභාවේ දැනට සේවය කරන ලද යම්කිසි සභාපතිවරයෙකුගේ,උප සභාපතිවරයෙකුගේ,මන්ත්‍රීවරයෙකුගේ හෝ සභාවේ සේවකයෙකුගේ ද සභාවේ කලින් සේවය කරන ලද සභාපතිවරයෙකුගේ,උප සභපතිවරයෙකුගේ,මන්ත්‍රීවරයෙකුගේ ද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය නොකෙරේ.

- මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාර දීමෙන් පසුව ආදාහනය කරන අතරතුරදී හෝ ආදාහනය කිරීමට පෙරාතුව හෝ ආදාහනාගාර යන්ත්‍ර සූත්‍ර වල කාර්මික දෝෂයක් හෝ විදුලි ඇන හිටීමක් හෝ නිසා මෘත දේහය ආදාහනය කිරීමට නොහැකි වුවහොත් එම මෘත දේහය භූමදානය කිරීමට තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතුය.

- ආදාහනාගාරයේ ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාර ගැනීම සතියේ සෑම දිනකම පෙ.ව. 7.00 සිට ප.ව. 8.00 දක්වා කාලය සිදු කරනු ලබයි.

- සෑම මෘත දේහයක්ම ආදාහනය කර පැය 72 ක් ගතවීමට පෙර ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් එකී මෘත දේහයේ භෂමාවශේෂ භාරගත යුතුය.

- මෘත දේහය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරය වෙන් කරවා ගන්නා අවස්ථාවේ මෘත දේහය ආදාහනය කිරීමෙන් පසු භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා මරණකරුගේ නම හා ලිපිනය සඳහන් භාජනයක් (තදින් මූඩිය වැසිය හැකි)මිය ගිය අයගේ ළඟම ඥාතීන් විසින් විසින් ආදාහනාගාර භාරකරු වෙත ලබා දිය යුතුය.

- ආදාහනාගාරයෙන් ඉවත් කරන භෂ්මාවශේෂ මිය ගිය අයගේ ළඟම ඥාතීන්ට හැර වෙනත් පුද්ගලයින්ට භාර දීම සිදු නොකළ යුතුය.

- එසේ වුවද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයාගේ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කරනු ලබයි. එසේ ආදාහනාගාරය භාරයේ තබා ගන්නා භෂ්මාවශේෂ ආදාහනය සිදු කළ දින සිට සති දෙකකට නොවැඩි විය යුතුය.

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ඊරියගොල්ල ආදාහනාගාරයේ සේවය කරන සේවක මහතුන්

i. ආදාහනාගාර ක්‍රියාකරුවන් 02

- එච්.එම්.එස්. නන්ද කුමාර මහතා



ජී.එල්.එච්. විජේරත්න මහතා



ii. ආදාහනාගාර සහායකයින් 02

❖ එම්.ආර්.පී. කුමාරසිරි මහතා



එල්.ආර්.ආර්. කුමාර මහතා



## ඊරියගොල්ල ආදාහනාගාරය වෙන් කිරීමේ ක්‍රියා පිළිවෙළ
## (ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය තුළදී ඔබ වෙත ලබා දෙන සේවාව)

01. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා දිනය සහ වේලාව වෙන් කර ගැනීමට පැමිණෙන තැනැත්තාගෙන් මිය ගිය තැනැත්තාගේ මරණය පිළිබඳ සහතිකය ගෙන එය පළමුව පරීක්ෂා කිරීම.

02. එකී වාර්තාව (බී 16, බී 18, බී 20 ආකෘතිපත්‍ර වලින් එකක් විය යුතුය.) (එම වාර්තාවේ මරණයට හේතුව හා භූමදානය හෝ ආදාහනය කළ යුතු ස්ථානය යන්නෙහි දෙහිඕවිට ඊරියගොල්ල ආදාහනාගාරය ලෙස නම් කර තිබිය යුතුය.)

03. අදාළ බලධාරීන්ගේ අනුමැතිය මත එකී මෘත ශරීරය ආදාහනය සඳහා සුදුසු වන්නේ නම් මිය ගිය තැනැත්තාගේ මරණය පිළිබඳ ඉහත සහතික වලින් පිටපතක් ලබා ගැනීම සිදු කරයි.

04.එකී වාර්තාව බී 18 (මරණ පරීක්ෂක තැනගේ සහතිකය) ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් අවශ්‍ය නොවන අතර, බී 16 හෝ බී 20 ඉදිරිපත් කරන අවස්ථාවේදී දිවුරුම් ප්‍රකාශයක් අයදුම්කරුගෙන් අනිවාර්යයෙන්ම ලබා ගත යුතුය.

04.මියගිය තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත/ රියදුරු බලපත්‍රය/වැඩිහිටි හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් ලබා ගැනීම සිදු කරයි.(මෙම ලියවිලි කිසිවක් නොමැතිනම් පදිංචිය සනාථ කර ග්‍රාම නිළධාරී සහතිකය ලබා ගැනීම යෝග්‍ය වේ.)

05.අයදුම්පත්‍රය සම්පූර්ණ කරන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත්‍රය/රියදුරු බලපත්‍රය/වැඩිහිටි හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් ලබා ගැනීම සිදු කරයි.

06.මෘත ශරීරය ආදාහනය කිරීමට අදාල අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර ඉහත සඳහන් පිටපත් අමුණා ගරු සභාපතිතුමා හෝ බලයලත් නිලධාරියා අනුමත කළ යුතුය.

07.අනතුරුව මිය ගිය පුද්ගලයාගේ පදිංචියට අනුව වාර්ෂික ගැසට් නිවේදනය ප්‍රකාරව ගාස්තු අය කර ලදුපතක් නිකුත් කිරීම සිදුවේ.

08.වේලාව ලබා දීමේදී මෘත ශරීර දෙකක් ආදාහනය කිරීම අතර වේලාව පැය 02 ක් විය යුතුය.

10. අනතුරුව මෘත දේහයක් ආදාහනය සඳහා නිකුත් කරන අවසර පත්‍රය සම්පූර්ණ කර ගරු සභාපතිතුමා හෝ බලය ලත් නිලධාරියා අත්සන් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරුට ලබා දී මුල් පිටපත ආදාහනාගාර භාරකරු වෙත ලබා දෙන ලෙස දැනුවත් කිරීම සිදු කරයි.

11.අදාල මුදල් අය කළ පසු ආදාහනය පිළිබඳ විස්තර කාර්යාලයේ පුවරුවේ සටහන් කර ආදාහනය සිදු කරන දිනය සහ වේලාව ආදාහනාගාර ක්‍රියාකරුට දැන්වීම සිදු කරයි.

(විනාඩි 10 ක් පමණ වන විට මෙම සේවාව දෙහිඕවිට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය තුළදී ලබා ගත හැක.)

## මෘත ශරීර ආදාහනය සඳහා වෙන් කර ගත හැකි වේලාවන්

ප.ව 02.00,ප.ව 04.00, ප.ව 06.00 ( පෙ.ව 10.00, ප.ව 12.00 ප.ව 8.00 අත්‍යවශ්‍ය සහ හදිසි සේවා)

(මෘත ශරීර දෙකක් ආදාහනය අතර වේලාව පැය 02 ක් බව කරුණාවෙන් සළකන්න)

## ❖ ගාස්තු අය කරන ආකාරය

වාර්ෂික ගැසට් නිවේදනය හා මහා සභා තීරණ අනුව ගාස්තු අය කිරීම සිදු කරයි.

## ඊරියගොල්ල ආදාහනාගාරය වෙන් කිරීමේදී අය කරනු ලබන ගාස්තු(2023 වර්ෂයට)

i.ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු 12,000.00

ii.ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු 14,000.00

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් අවමංගල්‍ය සේවා(කොවිඩ් මරණ ආදාහනය)

| සේවාව | ගාස්තුව (රු) |
|---|---|
| i.කාඩ්බෝඩ්වලින් සකස් කරන ලද මිනී පෙට්ටියක් සැපයීම (බල ප්‍රදේශය තුළ) | 5,500.00 |
| ii.කාඩ්බෝඩ්වලින් සකස් කරන ලද මිනී පෙට්ටියක් සැපයීම (බල ප්‍රදේශය පිටත) | 6,500.00 |
| iii.මිනී පෙට්ටියක් ප්‍රවාහනය කර දීම(කි.මී. 01 ක් සඳහා) | 150.00 |
| iv.මෘත දේහයක් අවසන් කටයුතු සඳහා (රෝහලේ සිට ප්‍රවාහනය,පෙට්ටිය සැපයීම,ආදාහනාගාර ගාස්තු,ආරක්ෂක ඇඳුම්,අවදානම් දීමනා සහිතව සභා බල ප්‍රදේශය තුළ) | 23,000.00 |
| v.මෘත දේහයක් අවසන් කටයුතු සඳහා (රෝහලේ සිට ප්‍රවාහනය,පෙට්ටිය සැපයීම,ආදාහනාගාර ගාස්තු,ආරක්ෂක ඇඳුම්,අවදානම් සහිතව සභා බල ප්‍රදේශයෙන් පිටත) | 25,000.00 |

- ✓ 04 වන සේවාව සඳහා ආරක්ෂිත ඇඳුම් රෝහලෙන් සැපයීම සිදු කරන අවස්ථාවකදී රු 2,000.00 ක් එම මුදලින් අඩු කරනු ලැබේ.
- ✓ අඩු ආදායම් ලබන දරිද්‍රතාවයෙන් පෙළෙන පවුලක කොවිඩ් මරණයක් සිද වූ අවස්ථාවක ආදාහන කටයුතු සිදු කිරීම සඳහා රු: 12,000.00 අය කරනු ලැබේ. (ග්‍රාම නිලධාරි වාර්තාව, ප්‍රාදේශීය ලේකම් සහතික කළ යුතුය)

**මෙම ගාස්තු මහා සභා තීරණ සහ වාර්ෂික ගැසට් නිවේදනය මත සංශෝධනය වේ.**

## ඊරියගොල්ල ආදාහනාගාරය තුළදී ඔබ වෙත ලබා දෙන සේවාව

01.ආදාහනාගාරයට ලබා දිය යුතු අවසර පත්‍රය ආදාහනාගාර ක්‍රියාකරු වෙත ලබා දුන් පසු එය පරීක්ෂා කර ලේඛනගත කිරීම සිදු කරයි.

02.අදාල ආදාහනයට පෙර ආදාහනයක් සිදු කර ඇත්නම් එහි අවශේෂ කොටස් ඉවත් කරන තුරු සිටිය යුතුය.

04.එම ස්ථානයේදී ආගමික වතාවත්(පාංශකූලය)සිදු කරන්නේ නම් එම කාර්යයන් සිදු කළ හැකිය.

05.ඉන් පසු වෙන් කර ඇති වේලාවට අනුව ආදාහන කටයුතු සිදු කරයි.

06.ඔබට ඥාතියාගේ භෂ්මාවශේෂ අවශ්‍ය වන්නේනම් ඒ සඳහා කුඩා මැටි කළයක්(තදින් මූඩිය වැසෙන) රැගෙන ආ යුතුය.

07.ආදාහන කටයුතු අවසන් කළ පසු භෂ්මාවශේෂ ඉවත් කරන අවස්ථාවේදී ඔබ විසින් ලබා දී ඇති මැටි කළයට භෂ්මාවශේෂ දමනු ලැබේ.(මෙම භෂ්මාවශේෂ ආදාහනය සිදු කර දින සිට දින 03 ක් ඇතුළත ඔබ විසින් ඉවත් කර ගත යුතුය.)

08.ආදාහනාගාර භූමියේ ඔබ විසින් මිය ගිය තැනැත්තා අනුස්මරණය කිරීමට පැළයක් සිටුවන්නේනම් ඔබ විසින් මල් පෝච්චියක් ලබා දී එම භෂ්මාවශේෂ තැන්පත් කර පැළය සිටුවීමට අවස්ථාව ඇත.

09.ඔබ විසින් ඇණවුම් කර ඇති භෂ්මාවශේෂ සඳහා දින 03 ක් යන තුරු කිසිදු ප්‍රතිචාරයක් නොමැතිනම් එම භෂ්මාවශේෂ ඉවත් කිරීම සිදු කරන බව කරුණාවෙන් සළකන්න.

10. ආදාහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම නොකළ යුතුය.

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අල්ගොඩ හා අටුළුගම පිහිටි වැඩිහිටි හා ආබාධිත නිවාස වල නේවාසිකව සිට මිය ගිය අයගේ දේහයන් ආදාහනය කිරීමේදී රු 10,000.00 ක සහන මිලකට ඊරියගොල්ල ආදාහනාගාරයේදී ආදාහනය කළ හැක.

## භූමදාන කටයුතු

ඊරියගොල්ල ආදාහනාගාර භූමියේ බල ප්‍රදේශය තුළ මිය ගිය අයගේ මෘත ශරීර භූමදානය සඳහා පහසුකම් සපයා ඇත.

❖ සාමාන්‍ය මරණ සඳහා, රණවිරුවන්ගේ මරණ සඳහා,අධිකරණ නියෝග මත සිදු කරන භූමදාන කටයුතු සඳහා වෙන් වෙන්ව ස්ථාන වෙන් කර ඇත.

## භූමදාන කටයුතු සඳහා ඊරියගොල්ල පොදු සුසාන භූමිය වෙන් කරන ක්‍රියා පිළිවෙළ

01.මිය ගිය තැනැත්තාගේ මරණ සහතිකය පරීක්ෂා කිරීම.

02.එම වාර්තාව බී 16, බී 18, බී 20 ආකෘතිපත්‍ර වලින් එකක් විය යුතුය. (එම වාර්තාවේ මරණයට හේතුව හා භූමදානය හෝ ආදාහනය කළ ස්ථානය යන්නෙහි දෙහිඕවිට ඊරියගොල්ල පොදු සුසාන භූමිය ලෙස නම් කර තිබිය යුතුය.)

03.එම මරණය සාමාන්‍ය මරණයක්ද, හදිසි මරණයක්ද යන්න පරීක්ෂා කර බැලිය යුතුය.(අධිකරණ වෛද්‍ය වාර්තාව පරීක්ෂා කිරීම අනිවාර්ය වේ.) අධිකරණ වෛද්‍යවරයා විසින් අදාළ භූමදානය සිදු කළ යුතු ස්ථානය පිළිබඳ සඳහන් කළ යුතුය.

04.අයදුම්කරුගෙන් මරණය භූමදානය කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක් ලබා ගැනීම.

05.මිය ගිය පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත හෝ වැඩිහිටි හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත් ලබා ගැනීම.

06.අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත/වැඩිහිටි හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත් ලබා ගැනීම.

07.ඉහත ලේඛන ගරු සභාපතිතුමාට/ලේකම්තුමාට ඉදිරිපත් කළ පසු භූමදානය කිරීමට නිර්දේශය ලබා දීම සිදු කිරීම.

08. පසුව අදාල භූමදානය සඳහා කාර්මික නිලධාරි වාර්තාව ලබා ගැනීම සිදු කරයි.

09.අනතුරුව භූමදානය කිරීම ගරු සභාපතිතුමා/ලේකම්තුමා අනුමත කිරීම.

10.ඉන් පසුව අදාල විස්තර සහිතව කාර්යාලය මගින් ලදු පතක් නිකුත් කිරීම සිදු කරයි.

11.ඉන් පසුව කාර්මික නිලධාරී විසින් විසින් අදාල භූමදානය සිදු කළ යුතු ස්ථානය සළකුණු කිරීම සිදු කළ යුතු අතර එම ස්ථානයට ඉඩමේ මායිමේ සිට ඇති දුර මැන දල සටහනක් ඉදිරිපත් කිරීම.

12.විෂය නිලධාරි විසින් එම දල සටහන් සුසාන භූමි ලේඛනයේ ලේඛනගත කිරීම.

13.මෙම මිනිදුන් කිරීම ආදාහනාගාර ක්‍රියාකරුට කාර්යාලය මගින් දැනුවත් කරන අතර, භූමදානය සිදු කිරීමේදී කාර්යාලයෙන් නිකුත් කළ ලදුපත ආදාහනාගාර ක්‍රියාකරුට පෙන්විය යුතුය.

14. ඔබ විසින් කාර්මික නිලධාරි නිර්දේශයට අනුව, ආදාහනාගාරුගේ දැනුවත්වීම මත භූමදානය සඳහා වළ සකසා ගත යුතුය.

15.ඔබ විසින් භූමියේ සරසන ලද ද්‍රව්‍ය අදාළ කටයුතු නිම කිරීමෙන් අනතුරුව ඉවත් කළ යුතුය.

16. ආගමික වතාවත් සිදු කරන්නේනම් එම භූමියේ ආගමික වතාවත් සිදු කිරීමට ඔබට අවස්ථාව ඇත.

- ඊරියගොල්ල ආදාහනාගාර පොදු සුසාන භූමියේ භූමිදාන කටයුතු සිදු කළ පසු මිහිදන් කටයුතු සඳහා ස්මාරක සෑදීමට අවසර දෙනු නොලැබේ.

<u>මිහිදන් කිරීම සඳහා ගාස්තු අය කිරීම(2023 වර්ෂයට)</u>

- එක් මෘත දේහයක් මිහිදන් කිරීම සඳහා රු 100.00 ක මුදලක් අය කිරීම සිදු කරයි.

**(මෙම ගාස්තු මහා සභා තීරණ සහ වාර්ෂික ගැසට් නිවේදනය මත සංශෝධනය වේ.)**

# දෙහිඕවිට ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.

01. මෘත ශරීරය ආදාහනය සඳහා
ඉල්ලුම් කරන්නාගේ නම :- ..............................

- ➢ ලිපිනය :- ..............................
- ➢ ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................
- ➢ දුරකථන අංකය :- ..............................
- ➢ මිය ගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධය :- ..............................

02. මිය ගිය තැනැත්තාගේ නම :- ..............................

- ➢ ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................
- ➢ පදිංචි වී සිටි ලිපිනය :- ..............................
- ➢ ග්‍රාම සේවා කොට්ඨාශය :- ..............................

03. මරණය සිදු වූ ආකාරය :- ..............................

04. මරණ සහතිකයේ අංකය හා දිනය :- ..............................
(මරණ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

05. මරණය ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :- ..............................

06. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :- ..............................

- ➢ පරීක්ෂණ නිළධාරියාගේ නම හා තරාතිරම :- ..............................
- ➢ පරීක්ෂණ නිළධාරියාගේ නිගමනය :- ..............................
- ➢ මෘත ශරීර ආදාහනය කිරීම අවසර ලබා දෙන්නේද යන වග :- ඔව් / නැත.

07. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :- දිනය:- .............................. වේලාව:- ..............................

08. ආදාහනයෙන් පසු භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නම හා ලිපිනය ලියූ භාජනයක් සපයා දී ඇත / නැත.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි.

අදාල සහතික අමුණා ඇත.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය:- ..............................

---

## කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි. / පහත සඳහන් හේතු මත අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ශේප කරමි.
..............................
..............................

සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

බලයලත් නිළධාරියා,

01. ලේඛණයේ සටහන් කරන ලදී.
.............................. දින සිට .............................. දරණ ලදු පතින් රු.............................. ක් අය කර ගන්නා ලද

02. අවසර පත්‍රය අත්සන සඳහන් ඉදිරිපත් කරමි.

03. ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූයේ නම් අදාල කරුණු ඇතුලත් ලිපිය අත්සන සඳහා ඉදිරිපත් කරමි.

දිනය:- ..............................

..............................
අත්සන

**<u>ඔබ විසින් මෘත ශරීරයක් ආදාහනය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ඊරියගොල්ල ආදාහනාගාරය වෙන් කිරීමේදී පහත ලියවිලි රැගෙන ආ යුතුය.</u>**

01.මිය ගිය පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත්‍රය(මිය ගිය තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත්‍රය නොමැති අවස්ථාවකදී පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය)

02.අයදුම්පත්‍රය සම්පූර්ණ කරන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත්‍රය

03. B-16 මරණ දැන්වීමේ සහතිකය/ B-18 මරණ පරීක්ෂක තැනගේ සහතිකය/ B-20 මරණ ලියාපදිංචි කිරීමේ සහතිකය යන ඒවායින් එකක්

04. B- මරණ පරීක්ෂකගේ සහතිකය නොමැති අවස්ථාවලදී (හදිසි මරණ පරීක්ෂණයකට ලක් නොකලේ නම්) B-16 හෝ 20 ආකෘතිපත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේදී දිවුරුම් පෙත්සමක් ලබා දිය යුතුවේ.(මුද්දරය මත අත්සන් කළ යුතුය.)

# <u>දිවුරුම් ප්‍රකාශයයි.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ............................. පළාතේ............................. දිස්ත්‍රික්කයේ ................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................ ග්‍රාම නිළධාරි වසමේ.................................................................................දරණ ස්ථානයේ ස්ථිර පදිංචි ........................ ජා.හැ.ප අංක දරණ ..................................................................................................... වන මම සිංහල/ද්‍රවිඩ/මුස්ලිම්/බෞද්ධ/හින්දු/ඉස්ලාම්/ක්‍රිස්තියානි/ ආගමිකයෙකු ලෙස අවංකවත්,සත්‍යවාදීවත් ගරු ගාම්භිරතා පූර්වකවත් ගෞරව බහුමානයෙන් යුතුව ප්‍රතිඥා දී/දිවුරා පහත සඳහන් පරිදි ප්‍රකාශ කරමි.

ඉහත නම සඳහන් මා විසින් ආදාහනය සඳහා ඔබ වෙත භාර දෙන ............................................................................................................................................ දරණ ලිපිනයෙහි ස්ථිර පදිංචිව සිට ........................ දින (මිය ගිය දිනය) ................................................. දී (මිය ගිය ස්ථානය) ........................................................ (මිය යාමට හේතුව) හේතුවෙන් මිය ගිය මාගේ ........................ (ඥාතිත්වය) වන ................................................................................................. නමැති අයගේ මෘත දේහය

........................ දින පෙරවරු/පස්වරු ................ ට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ඊරියගොල්ල ආදාහනාගාරයේදී ආදාහනය කිරිමට ඉල්ලීම් කරන බවත් ඒ පිළිබඳව පහත කරුණු සත්‍ය බවත් මා ප්‍රකාශ කරමි.

I. මෙම මරණය සාමාන්‍ය ස්වාභාවික මරණයක් බව හා මරණය පිළිබඳව සැකයක් නොමැති බවද,
II. හදිසි මරණ පරීක්ෂණයකට ලක්කල මෘත දේහයක් නොවන බව ද,
III. මෙම මෘත දේහය ආදාහනය කිරීම සම්බන්ධයෙන් මා දන්නා පමණින් නීතිමය ගැටළුවක් නොමැති බවද,
IV. මෘත දේහය ආදාහනය කිරීම සම්බන්ධයෙන් කිසියම් නීතිමය ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් සියලුම වගකීම් මා විසින් භාර ගන්නා බවද,
V. මෙම මෘත දේහය ආදාහනය සම්බන්ධයෙන් මිය ගිය අයගේ පවුලේ කිසිදු විරෝධතාවයක් නොමැති බවත් දිවුරා ප්‍රකාශ කරමි.

| 50/= |
|---|
| මුද්දරය |

...................................................
දිවුරුම් ප්‍රකාශක/ප්‍රකාශිකා

ඉහත සඳහන් ප්‍රකාශය එහි සිද්ධි ප්‍රකාශය/ ප්‍රකාශිකාව වෙත සිංහල භාෂාවෙන් කියවා තේරුම් කර දෙන ලදුව ඔහු/ඇය විසින් තේරුම් ගත් බවට සෑහීමකට පත්වීමෙන් ප්‍රතිඥා දී/දිවුරා මා ඉදිරිපිටදී ස්වකීය අත්සන යොදන ලදී.
වර්ෂ ................ ක් වූ ....................මස
............ දින ......................... දිය.

සාමදාන විනිශ්චයකාර තැන
(නිල මුද්‍රාව)

ඊරියගොල්ල ආදාහනාගාරය වෙන්කර ගැනීමට පැමිණීමේදී පහත ආකෘති පත්‍ර වලින් එකක් රැගෙන පැමිණිය යුතුය.

---

ඊ 023292 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

Registration B 20
(F 6* S., T. & E.) 8/58

# මරණය ලියාපදිංචි කිරීමේ සහතිකය

(42 (1) (ආ) වගන්තිය)

மரணப் பதிவு அத்தாட்சிப் பத்திரம்
(பிரிவு 42 (1) (அ) )

## CERTIFICATE OF REGISTRATION OF DEATH

*(Section 42 (1) (a) )*

අංකය
இல.
No.

............................................ කොට්ඨාශය........................................ දිස්ත්‍රික්කය

............................................ பிரிவு........................................ பெரும்பகுதி

*Division* :............................................ *District* :............................................

මෙහි පහත විස්තර කරන මරණය පිළිබඳ දැන්වීම අද දින ........................................

පදිංචි ............................................ගෙන් මට ලැබී එය මවිසින් ලියාපදිංචි කරන ලදී :

........................................................................................ வாசியாகிய

........................................................................................ என்பவர்

கீழ்க்காட்டிய மரணத்தைப்பற்றி இன்று எனக்கறிவித்தல் கொடுத்து, நான் அதனைப் பதிவு செய்திருக்கின்றேன்.

I have this day received from............................................................................

of ........................................................................................

............................................, notice of, and registered, the following death. :

| | |
|---|---|
| 1. මරණය සිදුවූ දිනය හා ස්ථානය<br>இறந்த திகதியும் இடமும்<br>Date and place of Death | |
| 2. සම්පූර්ණ නම<br>முழுப் பெயர்<br>Full Name | |

[අනිත් පිට බලන්න/ம. ப. பார். /P. T. O.

| | |
|---|---|
| 3. ස්ත්‍රී පුරුෂ භාවය හා ජාතිය*<br>பால், சாதி*<br>Sex and Race* | |
| 4. වයස<br>வயது<br>Age | |
| 5. මරණයට හේතුව<br>மரணத்திற்குக் காரணம்<br>Cause of Death | |

.................................
රෙජිස්ට්‍රාර් / பதிவாளர் / *Registrar.*

19........................................................ දින දීය.

19....ம் ஆு.....................ந் உ.

*Date of issue :*

*දෙමළ ජාතිකයින් හෝ මරක්කල ජාතිකයින් "ලාංකික" දෙමළ හෝ මරක්කල නැතහොත් "ඉන්දියානු" දෙමළ හෝ මරක්කල කියා අවස්ථානුකූලව විස්තර කළ යුතුයි.

*தமிழர் அல்லது சோனகரை " இலங்கைத் தமிழர் " அல்லது " இலங்கைச் சோனகர் " அல்லது " இந்தியத் தமிழர்" அல்லது " இந்தியச் சோனகர் " என விவரித்தல் வேண்டும்.

*Tamils or Moors must be described as "Ceylon Tamil" or "Ceylon Moor" or "Indian Tamil" or "Indian Moor" as the case may be.

H 040476 – 50,000 (2012/07)P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

**Registration B16**
(F 4* S. T. & E.) 02/82

# මරණ දැන්වීමේ සහතිකය (41 (1) (අ) වගන්තිය)
## மரண அறிவித்தல் கொடுத்ததற்கான அத்தாட்சிப் பத்திரம் (பிரிவு 41 (1) (அ)
## CERTIFICATE OF NOTICE OF DEATH (Section 41 (1) (a))

අංකය / இல. / *No.* }

කොට්ඨාසය / பிரிவு / *Division* } ....................................... දිස්ත්‍රික්කය / மாவட்டம் / *District* } .......................................

............................................................................................ යන තැනැත්තාගේ
මරණය සිදුවියයි දැන්වීමක් ............................................................ පදිංචි
............................................................................................ නමැති අයගෙන්
............................................................................................ දින මට ලැබුණු බැව් මෙයින් සහතික කරමි.

............................................................................................ என்பவருடைய மரணத்தைப்பற்றி
............................................................................................ வாசியாகிய ..............................
............................ என்பவர் எனக்கு இன்று அறிவித்தல் கொடுத்திருக்கிறாரெனபதை நான் உறுதிப்படுத்துகிறேன்.

I certify, that I have this day received from ............................................................
............................ of ............................................................, notice of the death of
............................................................................................

| | |
|---|---|
| 1. මරණය සිදු වූ දිනය හා ස්ථානය<br>இறந்த திகதியும் இடமும்<br>Date and place of death | |
| 2. සම්පූර්ණ නම<br>முழுப்பெயர்<br>Full name | |

(අ පි. බ. / மபபா. / P. T. O.)

| | | |
|---|---|---|
| 3 | ස්ත්‍රී පුරුෂ භාවය හා ජාතිය*<br>பால் மற்றும் சாதி*<br>Sex and Race* | |
| 4 | වයස<br>வயது<br>Age | |
| 5 | මරණයට හේතුව<br>மரணத்துக்குக் காரணம்<br>Cause of death | |

නිකුත් කළ දිනය
கொடுக்கப்படும் திகதி
*Date of issue* } ..........................................

රෙජිස්ට්‍රාර්
பதிவாளர்
*Registrar* } ..........................................

*දෙමළ ජාතිකයින් හෝ මරක්කල ජාතිකයින් "ශ්‍රී ලංකා" දෙමළ හෝ යෝනක නැතහොත් "ඉන්දියානු" දෙමළ හෝ යෝනක කියා අවස්ථානුකූලව විස්තර කළ යුතුයි.

* தமிழர் அல்லது சோனகரை "இலங்கைத் தமிழர்" அல்லது "இலங்கைச் சோனகர்" அல்லது "இந்தியத் தமிழர்" அல்லது "இந்தியச் சோனகர்" என விவரித்தல் வேண்டும்.

* Tamils or Moors must be described as "Sri Lanka Tamil" or "Sri Lanka Moor" or "Indian Tamil" or "Indian Moor" as the case may be.

# මරණ පරීක්ෂක තැනගේ සහතිකය [39 (1) සහ 41 (1) (උ) වගන්ති]

## மரண விசாரணைக்காரரின் அத்தாட்சிப் பத்திரம் [பிரிவுகள் 39 (1), 41 (1) (உ)]

## INQUIRER'S CERTIFICATE OF DEATH [Section 39 (1) and 41 (1) (e)]

[වෛද්‍ය අවශ්‍යතා ආඥාපනතේ (226 වෙනි පරිච්ඡේදයේ) බලයට යටත් කරන ලද වත්තක මරණය සිද්ධ වී නම්, මේ සහතික පත්‍රය කොට්ඨාශයේ ලේකම් වෙතට නොව වත්ත පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් වෙතට යැවිය යුතුයි. තවද මෙම සහතික පත්‍රය විභාගය අවසානවී දින පහක් ඇතුළත යැවිය යුතුයි.]

[வைத்திய தேவைச் சட்டத்தின் (அதிகாரம் 226) கீழ் பதியப்பட்டிருக்கும் தோட்டத்தில் மரணம் சம்பவித்தால் இந்தப் பத்திரம் அந்தப் பிரிவுப் பதிவுகாரருக்கல்லாது, அந்தத் தோட்டமிருக்கும் பெரும்பகுதியின் பெரும்பகுதிப் பதிவுகாரருக்கு அனுப்பப்பட வேண்டும். யாருக்கனுப்புவதானாலும் மரண விசாரணை முடிந்தபின் ஐந்து நாட்களுக்குள் அனுப்பப்படவேண்டும்.]

[If the death occurred on an estate scheduled under " The Medical Wants Ordinance " (Chap. 226) this certificate should be, forwarded, not to the Divisional Registrar, but to the District Registrar of the District in which the estate is situated. In either case the certificate should be forwarded within 5 days after the conclusion of the inquiry.]

________________ මරණ පරීක්ෂක වන ________________

________________ නැමති මම *අද දින අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ, ________________

________________ පදිංචිව සිටි ________________

නමැත්තාගේ මෘත ශරීරය පිළිබඳව විභාගයක් පැවැත්වූ බවද, මෙහි පෙනෙන උපලේඛනයේ සඳහන් විස්තර කරුණු සැබෑ බව හා නිවැරදි බවද මෙයින් සහතික කරමි. තවද එකී මෘත ශරීරය ආදාහන කිරීම හෝ භූමදාන කිරීම සඳහා බලයද මෙයින් පවරමි.

________________ *என்பவரும்

________________ மரண விசாரணைக்காரருமாகிய நான

குற்றவியல் விவகாரமுறைச் சட்டத்தின் ஏற்பாடுகளின் பிரகாரம் ________________

________________ வாசியாகிய ________________

________________ என்பவரின் பிரேதத்தை இன்று பரிசோதனை செய்தேனென்பதையும் இதன் அட்டவணையிற் காட்டிய விடயங்கள் உண்மையும் சரியும் என்பதையும் உறுதிப்படுத்திக் குறித்த பிரேதத்தை அடக்கம் அல்லது தகனம் செய்வதற்கு இத்தால் அனுமதியளிக்கிறேன்.

I * ________________

Inquirer into Deaths, of . ________________ certify

that I have this day held an inquiry under the provisions of the Criminal Procedure Code on the dead body of . ________________

________________ of . ________________ and that the particulars stated in the schedule hereto are true and correct, and I hereby authorize the burial or cremation of the said body.

20 ___ ක්වූ ________ මස ________ දින,

________________ දීය.

________________ இல்.

20 ___ ம் ஆண்டு ________ மீ ________ ந் திகதி

Date at ________________ this ________________ day

of ________________ 20 ___

________________

මරණ පරීක්ෂක තැන/மரண விசாரணைக்காரர்

*Inquirer into Deaths.*

*(මරණ පරීක්ෂක ඇතුළු) සියලු නම්වල නාම සම්පූර්ණයෙන් ලිවිය යුතුයි. නාමවල මුල් අකුරු පමණක් ප්‍රමාණවත් නො වේ.

*ஆட்களின் பெயர்கள் (மரண விசாரணைக்காரர் உட்பட) பூரணமாக எழுதப்பட வேண்டும். பெயரின் முதலெழுத்துக்கள் மட்டும் போதா.

*Names of persons (including the inquirer himself) should be written in full. Initials of names are not sufficient.

ආ.මු.ව./(අ.ப.ப. ...)

H 027605 – 1,00,000 (2006/10) P ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# උප ලේඛනය
## அட்டவணை
## SCHEDULE

| | |
|---|---|
| 1. මරණය සිදුවූ දිනය හා ස්ථානය<br>இறந்த திகதியும் இடமும் (கிராமம் அல்லது வாட் பிரிவு, தெரு, வீட்டிலக்கம்)<br>Date and Place of Death (Village or Ward, Street and No. of House) | |
| 2. සම්පූර්ණ නම* හා පදිංචි ස්ථානය<br>முழுப் பெயரும்* வதியுமிடமும்<br>Full name* and residence | |
| 3. ස්ත්‍රී පුරුෂ භාවය හා ජාතිය†<br>பால், தேசிய இனம்†<br>Sex and race† | |
| 4. වයස/வயது/Age | |
| 5. තත්ත්වය නොහොත් වෘත්තිය<br>அந்தஸ்து அல்லது தொழில்<br>Rank or profession | |
| 6. මවපියන්ගේ සම්පූර්ණ නම<br>பெற்றோரின் முழுப் பெயர்<br>Parents full names<br>පියා / தந்தை / Father<br>මව / தாய / Mother | |
| 7. මරණයට හේතුව ‡ (මිනිමැරීමද සියපන හානිකර ගැනීමද නැතහොත් හදිසි මරණයක්ද යන්න සඳහන් කරනු)<br>மரணத்துக்குக் காரணம ‡(மரணம் கொலையினாலோ, தற்கொலையினாலோ அல்லது விபத்தினாலோ என்பதைக் குறிப்பிடுக)<br>Cause of death ‡(also state whether the death is due to homicide, suicide or accident) | |

*මරණ පරීක්ෂක තැන ඇතුළු සියල්ලන්ගේ නාම සම්පූර්ණයෙන් ලිය යුතුය. නාමවල මුල් අකුරු පමණක් ප්‍රමාණවත් නොවේ.

†දෙමළ ජාතිකයින් "ලාංකික" දෙමළ හෝ මරක්කල නැතහොත් "ඉන්දියානු" දෙමළ හෝ මරක්කල කියා අවස්ථානුකූලව විස්තර කළ යුතුයි. ජාතිය ඇඟවීම පිණිස බොහෝ විට යොදන "බ්‍රාහ්මණයා" "හින්දුකාරයා" "මහමත්කාරයා" ආදී පද නොයෙදිය යුතුයි.

‡ මරණය ස්වාභාවික කරුණකින් නොව වෙන හේතුවකින් සිදු වූ එකක් නම් මරණය සිද්ධ වීමට හේතුවූ සත්‍ය කාරණය 7 වෙනි තීරයේ ලිය යුතුයි. දියේ ගිලීමෙන් මරණය සිද්ධ වී නම්, වළ, ළිඳ, වැව, ගඟ, මුහුද යනාදි යම් ස්ථානයක ගිලීම වූයේද ඒ ස්ථානය කිය යුතුයි. මරණය පිලිස්සීමෙන් සිද්ධ වී නම් පිළිස්සීම සිද්ධවූයේ බෝතල ලාම්පුවකින්ද නොහොත් වෙන ආකාර භූමිතෙල් ලාම්පුවකින්ද එසේ නැත්නම් වෙන කොයි අන්දමකින්ද කියාත් යොදනු.

ස්වාභාවික කරුණු නිසා අහියම් මරණයක් වී නම් ඒ සම්බන්ධව මරණයට ප්‍රධාන හෙවත් ආසන්න හේතුව කියන තැනට පසුව "ස්වාභාවික හේතු". යන වචන යොදනු.

උදාහරණ :—

(i) වාතය ගමනා ගමනය කරන මාර්ගයකම ගෙඩියක් ගැසි සාරේ යාමෙන් හුස්ම බාධාවීම—ස්වාභාවික හේතු.

(ii) කකුලේ වණයක නිසා පිටගැස්ම—ස්වාභාවික හේතු.

*ஆட்களின் பெயர்கள் (மரண விசாரணைக்காரர் உட்பட) பூரணமாக எழுதப்பட வேண்டும். பெயரின் முதலெழுத்துக்கள் மட்டும் போதாது.

†தமிழர் அல்லது சோனகரை "இலங்கைத் தமிழர்" அல்லது "இலங்கைச் சோனகர்" அல்லது "இந்தியத் தமிழர்" அல்லது "இந்தியச் சோனகர்" என விபரித்தல் வேண்டும். பலமுறையும் சாதியைக் காட்டுதற்காக எழுதப்படும் பிராமணம் "பிராமணன்", "இந்து", "மகமதியன்" என்னும் சொற்கள் சமயத்தையேயல்லாது சாதியைத் காட்டாதபடியால், விலக்கப்பட வேண்டும்.

‡துன் மரணமாயிருந்தால் அதற்குக் காரணமாயிருந்த உண்மையான சம்பவம் 7 ஆவது கூட்டிலெழுதப்பட வேண்டும். நீரில் அமிழ்ந்தி இறந்தால், குழியிலா, கிணற்றிலா, குளத்திலா, ஆற்றிலா, கடலிலாவென்பது எழுதப்படவேண்டும் அக்கினியினுல் இறந்தால் போத்தல் விளக்கினுலா வேறு மண்ணெண்ணெய் விளக்கினுலா அல்லது வேறு விதத்தினுலான்பது எழுதப்படல் வேண்டும்.

இயற்கைக் காரணத்தினுலே சம்பவித்த சடுதி மரணமாயிருந்தால் "இயற்கைக் காரணம்" என்ற சொற்கள் பின்வருமாறு இறந்த காரணத்துக்கு அடுத்து எழுதப்படவேண்டும் :—

(i) காற்றுத் துவாரங்களுக்குள்ளே புண்கட்டிவெடிப்பதால் வந்த மூச்சடைப்பு—இயற்கைக் காரணம்.

(ii) காலிலுள்ள புண் கட்டினுல் வந்த ஏற்புச் சன்னி—இயற்கைக் காரணம்.

* Names of persons (including the Inquirer himself), should be written in full, initials of names are not sufficient.

† Such terms as "Brahmin", "Hindu", "Muslim", &c, which are often used to denote race should be avoided as they indicate not race but the religious denomination. Tamils or Moors must be describes as "Ceylon Tamil" or "Ceylon Moor" or "Indian Tamil" or "Indian Moor", as the case may be.

‡ In the case of a violent death, the actual event which caused it should be given in column 7. Where death is due to drowning it should be stated whether the deceased was drowned in a pit, well, tank, river or sea (as the case may be). Where death is due to burning, it should be stated whether it was caused by a bottle lamp, other kerosene oil lamp or otherwise.

In the case of sudden death due to natural causes, the words "natural causes" should be added after the immediate or primary cause of death, as, eg.—

(i) Suffocation due to the bursting of an abscess into the air passage—natural causes.


(ii) Tetanus due to an ulcer in the leg—Natural causes.

19

❖ සිත් ඇදගන්නා සුළු මනරම් පරිසරය










❖ ආගමික වතාවත් කිරීමට වෙන් කර ඇති ස්ථානය





❖ අවසන් ගෞරවය සහ ආගමික වතාවත් සිදු කිරීමේ පහසුකම්






❖ කාර්යක්ෂම සේවා පහසුකම්






❖ රථ වාහන නවතා තැබීමට පහසුකම්






❖ සනීපාරක්ෂක පහසුකම්






❖ ජල පහසුකම්





❖ ඔබගේ ආරක්ෂාව තහවුරු කිරීමට සී.සී.ටී.වී. කැමරා පද්ධතිය









❖ ගිණි නිවීමේ උපකරණ



❖ ඔබගේ ඥාතියාගේ භෂ්මාවශේෂ තැන්පත් කර සිහි වීමට වටිනා/අලංකාර පැළයක් සහන මිලට සිටුවීමට අවස්ථාව








❖ රණවිරුවන් සිහිවීම සඳහා ස්මාරක සහිතව වෙනම ස්ථානයක් වෙන් කර ඇත.



❖ හදිසි මරණ භූමදානය සඳහා වෙනම ස්ථානයක් වෙන් කර ඇත.





❖ සාමාන්‍ය මරණ භූමදානය සඳහා වෙන් කර ඇත.




කාර්යාලය





දහන කුටීරය



ගෑස් ගබඩාව




විදුලි ජනන යන්ත්‍රය



- **ගෑස් මිල ඉහළ යාම හේතුවෙන් ආදාහනාගාර ගාස්තු 2023.01.11 දින සිට පහත පරිදි සංශෝධනය කර ඇත.**

i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු 11,000.00

ii..ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු 13,000.00

- පහත QR කේතය භාවිත කර ආදාහනාගාරයේ අතුරු ව්‍යවස්ථාව ලබා ගන්න.

- පහත QR කේතය භාවිත කර මෘත ශරීර ආදාහනය සඳහා ඊරියගොල්ල ආදාහනාගාරය වෙන් කර ගන්න.